රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:15/90

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

1990 මාර්තු මස 09 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන්, ආණ්ඩුකාරවරුන්ගේ ලේකම්වරුන්,
රාජ්‍ය සංස්ථාවල සභාපතිවරුන්,
රජයට අයත් සමාගම්වල සභාපතිවරුන් සහ
රජයට අයත් ව්‍යාපාරික ආයතනවල නිසි බලධාරීන් වෙත.

**<u>රාජ්‍ය සේවය, පළාත් සභා රාජ්‍ය සේවය සහ සංස්ථා අංශය සඳහා අනාගතයේදී කාර්ය මණ්ඩල බඳවා ගැනීම පිළිබඳ ජාතික ප්‍රතිපත්ති.</u>**

රාජ්‍ය සේවය. (දීප ව්‍යාප්ත සේවා සහ මධ්‍යම සේවා) පළාත් රාජ්‍ය සේවය සහ රාජ්‍ය සංස්ථා අංශය (රාජ්‍ය සංස්ථා, රජය සතු සමාගම්/ වෙළඳ ව්‍යාපාර) සඳහා අනාගතයේදී කාර්ය මණ්ඩල බඳවා ගැනීම සහ උසස් කිරීම් මගින් පත්වීම් දීම පහත දක්වා ඇති ප්‍රතිපත්තිය මත කළයුතු යයි රජය තීරණය කර ඇත.

02. (1). ලිපිකරු ශ්‍රේණි සහ ඉන් ඉහළ ශ්‍රේණි සඳහා බඳවාගැනීමේ
<u>නිශ්චිත මිම් පහත සඳහන් පරිදි වනු ඇත.</u>

(අ) සියළුම පත්වීම් දේශපාලන අනුග්‍රහයෙන් තොර විය යුතුය;

(ආ) පත්වීම් මුළුමනින්ම කුසලතා මත විය යුතුය. පහත දැක්වෙන "උ" "ඌ" සහ "එ" දරන නිශ්චිත මිම්වලට එවා යටත් විය යුතුය.

(ඉ) සියළුම තනතුරු සඳහා අනුමත බඳවාගැනීමේ පරිපාටියක් තිබිය යුතුය.

(ඊ) කුසලතාව නිශ්චය කළයුතු වන්නේ ලිඛිත විභාගයකින් හෝ ලිඛිත පරීක්ෂණයකින් හෝ වෘත්තීය පරීක්ෂණයකිනි. එක් ඉල්ලුම්කරුවෙකු පමණක් සිටින අවස්ථාවක සම්මුඛ පරීක්ෂණයක් පැවැත්විය යුතුය.

(උ) 90.01.01 දින සිට බලපවත්වන පරිදි රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා අංශය සහ සම්පූර්ණයෙන්ම රජයට අයත් සමාගම් සඳහා බඳවාගනු ලබන්නන් පහත (එ) දරන නියමයට යටත්ව ජනගහන පදනම මත දිස්ත්‍රික්ක අතර බෙදා හැරිය යුතුය. දිස්ත්‍රික්ක ජනගහන අනුපාතය (සියයට ගණන) අනුපාත සටහනකට අනුව වියයුතුය.

(1 ඇමුණුම). පළාත් රාජ්‍ය සේවය සම්බන්ධයෙන් අදාල පළාත ඇතුලත තිබෙන දිස්ත්‍රික්ක කෙරෙහි මෙම ප්‍රතිපත්තය පහත දැක්වෙන (එ) නියමයට යටත්වද අදාල වනු ඇත.

(ඉ) ඇතැම් දිස්ත්‍රික්කවලට ඉහත සඳහන් ("උ" හි සඳහන් පරිදි) වෙන්කරන ලද තනතුරු එම දිස්ත්‍රික්ක විසින් අන්තර්ග්‍රහණය කරගනු නොලැබේ නම් ජනගහන අනුපාත පදනම් කරගෙන එම තනතුරු සංඛ්‍යාව පළාත තුළ යාබද දිස්ත්‍රික්කවලට නැවත බෙදාහරිනු ඇත.

(එ) 90.01.01 දින සිට බලපවත්වන පරිදි ජාතික මට්ටමින් බඳවාගැනීම් සහ උසස්කිරීම් ජාතික ජනවාර්ගික අනුපාතය අනුව විය යුතුය. පළාත් මට්ටමින්" එය පළාත් ජනවාර්ගික අනුපාතය අනුව වේ. ඉහත සඳහන් (අ) සිට (ඉ) දක්වා යටත්වන පරිදි එය දිස්ත්‍රික් මට්ටමින් දිස්ත්‍රික් ජනවාර්ගික අනුපාතය අනුව වන්නේය.

සිංහල ජනතාව සඳහා ජනවාර්ගික අනුපාතය වන්නේ මුළු ඇබෑර්තු සංඛ්‍යාවෙන් 75% කි. ද්‍රවිඩ පුද්ගලයන්, ඉන්දියානු සම්භවයක් ඇති පුද්ගලයින්" සහ මුස්ලිම්වරුන් පිළිවෙලින් 12.7%, 5.5% සහ 8% යන අනුපාතය අනුව තෝරා ගනු ඇත. කෙසේ වෙතත් නිශ්චිත සංඛ්‍යාව තීරණය කිරීමේ අපහසුතාවයක් පැන නගින්නේ නම් 2% ක අඩුකිරීමක් හෝ" එකතු කිරීමක් වැනි වෙනසකට ඉඩදිය හැකිය. පළාතක් තුළ බඳවාගැනීම් සහ උසස්වීම් කෙරෙනුයේ යම් පළාත් සභාවක් ඇතුළත තිබෙන ජනවාර්ගික අනුපාත අනුවය. දිස්ත්‍රික්කයක් තුළ බඳවාගැනීම් සහ උසස්වීම් කෙරෙනුයේ යම් දිස්ත්‍රික්කයක් ඇතුළත තිබෙන ජනවාර්ගික අනුපාතය අනුවය. පළාතක ජනාවාර්ගික අනුපාත, අනුපාත සංඝනකට අනුව විය යුතුය. (1 ඇමුණුම).

(ඒ) සම්මුඛ පරීක්ෂණයක් අදාල විය යුත්තේ සුදුසුකම්, සහතික සහ මනා සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර බැලීම සඳහා පමණි.

ii. ලිපිකරු ශ්‍රේණිවලට වඩා පහළ තනතුරුවලට බඳවාගංනීමේ මිනුම් දණ්ඩ <u>පහත සඳහන් පරිදි වේ.</u>

(අ) 90.01.01 දින සිට බලපවත්වන පරිදි රාජ්‍ය සංස්ථා අංශයේ හැර ලිපිකරු ශ්‍රේණිවලින්" පහළ සියළුම තනතුරුවල ඇබෑර්තු සඳහා කරනු ලබන බඳවාගැනීම් දිස්ත්‍රික් මට්ටමින්" විය යුතුය. ඇබෑර්තු පවතින දිස්ත්‍රික්කයේ ප්‍රමාණය දෙගුණ වන අනුපාතයක් ලැබෙන පරිදි දිස්ත්‍රික්ක මට්ටමින් ඇති ඇබෑර්තු බෙදා හැරිය යුතුය.

රාජ්‍ය සංස්ථා අංශයට අදාල වන ප්‍රතිපත්තිය සහ මූලධර්ම අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් පරීක්ෂාකර අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරනු ඇත.

(ආ) සියළුම තනතුරු දේශපාලන අනුග්‍රහයෙන් තොර විය යුතු අතර, ඒවා පහත සඳහන් (ඉ) සහ (ඊ) දරන නිශ්චිත මිම්වලට යටත්ව කුසලතා මත විය යුතුය. කුසලතාව නිශ්චය කළයුත්තේ විභාගයකින් හෝ ලිඛිත පරීක්ෂණයකින් හෝ වෘත්තීය පරීක්ෂණයකිනි.

(ඉ) 90.01.01 දින සිට බලවපත්වන පරිදි ඉහත (අ) යටතේ බඳවා ගැනීමේදී දිස්ත්‍රික්කය තුළ සමන්විත ජනගහනයෙන් අදාල ජනවර්ගයට වෙන් කෙරෙන තනතුරු ප්‍රමාණයක් ඊට හිමිවන බවට වගබලා ගත යුතුය. දිස්ත්‍රික්කයෙහි ජනවාර්ගික අනුපාත, අනුපාත සටහනකට අනුව විය යුතුය (iii ඇමුණුම),

(ඊ) ඇබෑර්තු සංඛ්‍යාව බෙදා හංරීමේදී යම් දිස්ත්‍රික්කයකට වෙන් කරනු ලබන තනතුරු සංඛ්‍යාව එම දිස්ත්‍රික්කය අන්තර්ග්‍රහණය නොකරන්නේ නම් එම තනතුරු සංඛ්‍යාව අදාල පළාත තුල පිහිටි යාබද දිස්ත්‍රික්ක අතර නැවත බෙදා හරිනු ඇත.

3 (i) රාජ්‍ය සේවය
(ii) රාජ්‍ය සංස්ථා අංශය සහ
(iii) පළාත් සේවය

යන සේවාවන්හි ශ්‍රේණියෙන් ශ්‍රේණියට පදනම මත කෙරෙන උසස්වීම් ද ඇතුළුව සියළුම උසස්වීම් එවැනි සේවාවන්ට අදාල ජනවාර්ගික අනුපාතය පිළිබඳ ප්‍රතිපත්තිය මත පිහිටි 1990.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සිදු කළ යුතුය.

1987, 1988, 1989 ආදී පූර්ව වසරවල ඇබෑර්තු පිරවීමේ අවස්ථා වැනි 1990.01.01 දිනෙන් පසුව උසස්වීම් දැංනටමත් සිදුකර ඇති අවස්ථාවලදී, එම උසස්වීම්වලට බාධා නොකළ යුතුය. අධිසේවක පදනම මත තනතුරු ඇති කිරීමෙන් එවැනි අවස්ථාවලදී ජනවාර්ගික අනුපාතය ක්‍රියාත්මක කළයුතුය.

නිශ්චිත කාල පරිච්ඡේදයකින් පසුව ශ්‍රේණියෙන් ශ්‍රේණියට අනිවාර්යෙන්ම උසස් කිරීමේ අවස්ථාවලදී, එවැනි සේවාවක පවත්වා ජනවාර්ගික අනුපාතය පෙන්නුම් නොකරන අවස්ථා වැනි පැන නැගිය හැකි වෙනත් ගැටළු සහ ප්‍රශ්න විසඳාලීම සඳහා යෝජනා ක්‍රමයක් රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ ස්වදේශ කටයුතු අමාතයාංශයේ ලේකම් සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් පිළියෙල කරනු ඇත.

04. ඒ ඒ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා විසින් පළාත් සභා රාජ්‍ය සේවාවලට බඳවා ගැනීම් කළයුත්තේ අංක:56/89 හා 89.11.15 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය අංශයෙහි සහ පළාත් පාලන සේවයෙහි දැනටමත් සිටින නිලධාරීන් අන්තර්ග්‍රහණය කර ගැනීමෙන් සහ පත්කර ගැනීමෙන් පසුව පමණකි.

05. උසස්වීම් දීමට අදාලව තිබෙන මුළු තනතුරු සංඛ්‍යාව ස්වල්පයක් නම් එවැනි විශේෂ අවස්ථාවන්හිදී ජනවාර්ගික අනුපාතය පල කරගත නොහැකි වනු ඇත. (උදාහරණයක් වශයෙන් එම තනතුරු සංඛ්‍යාව 4 ට අඩු අවස්ථාවන්හි) එබැවින් එබඳු අවස්ථාවක එවැනි අනුපාතයක් අදාල කිරීමට නොහැකි වනු ඇත. එබඳු අවස්ථාවන්හිදී තෝරා ගැනීම් නිශ්චය

කෙරෙන එකම මිම්ම වනුයේ කුසලතා වයයි. එවැනි සෑම අවස්ථාවක්ම පහත සඳහන් 8 දරණ ඡේදය යටතේ පිහිටුවා අංකිත කමිටුව වෙත දැක්විය යුතුය. එවැනි අවස්ථාවක් ගැන වාර්තා කිරීමට නොමැති නම් "කිසිත් නැත" යනුවෙන් වාර්තාවක් සෑම හය මාසයකට වරක් ඉදිරිපත් කළයුතුය.

06. දැනට තිබෙන බඳවා ගැනීමේ පරිපාටි සංශෝධනය කිරීමට පත්කිරීමේ බලධරයන් අවශ්‍ය පියවර ගත යුතුය. විවිධ තනතුරුවල ඇබෑර්තු පිළිබඳ සියළුම තොරතුරු නියමිත කාලයෙන් වසරකට කලින් දැනගන්නට සලස්වන බවට පත්කිරීමේ බලධරයන් වගබලා ගත යුතුය. විභාගයක් පැවැත්වීමට නියමිත අවස්ථාවකදී විවිධ විභාගවලට සූදානම්වීමට අපේක්ෂකයන්ට පිළිවන් වනු පිණිස අදාල ආයතන විෂය නිර්දේශයන් කලට වේලාවට පලකළ යුතුය. විභාග සහ සම්මුඛ පරීක්ෂණ අයදුම්කරු තෝරා ගන්නා භාෂා මාධ්‍යයකින් පැවැත්විය යුතුය.

07. තම උත්තර පත්‍ර නැවත පරීක්ෂා කරවා ගැනීමට විභාග අපේක්ෂකයන්ට හැකිවන පරිදි සමීක්ෂණ මණ්ඩලයක් මෙම පත්කිරීම් බලධාරීන් විසින් පත්කොට අවශ්‍ය අවස්ථාවන්හි දී විධිවිධාන යෙදිය යුතුය. අවශ්‍ය විට ප්‍රතිකර්ම නිර්දේශ කිරීමේ බලතල එම මණ්ඩලයට තිබිය යුතුය.

08. ඉහත සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කරවීමේ කටයුතු මෙහෙයවනු පිණිස රාජ්‍ය පරිපාලන. පළාත් සභා හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය කමිටුවක් පත්කරනු ඇත. එම ක්‍රියා පරිපාටිය අනුව වසරක් කටයුතු කිරීමෙන් පසු එම කමිටුව එහි ක්‍රියාකාරිත්වය විමර්ශණය කිරීමෙන් අනතුරුව ඇගැයීම් කොට ඒ පිළිබඳ තම නිර්දේශයන් රජයට ඉදිරිපත් කරනු ඇත.

09. ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් සියළුම අමාත්‍යාංශ ලේකම්වරු, පළාත්සභා ප්‍රධාන ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, රාජ්‍ය සංස්ථා සභාපතිවරුන්, රජයට අයත් ව්‍යාපාරයන්හි සභාපතිවරුන් සහ රජයට අයත් වෙළෙඳ සමාගම්වල නිසි බලධාරීන් විසින් මෙම පරිපාටිය ක්‍රියාත්මක කළයුතුය. මෙම පරිච්ඡේදයේ කලින් සඳහන් කරන ලද නිලධාරීහු මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව වගකිව යුතු වෙති.

10. සංස්ථා සහ රජය සතු සමිගම් මෙම තීරණයන් තම අධ්‍යක්ෂ මණ්ඩලවල මී ලඟ රැස්වීම්වලදී ඔවුන්ගේ අවධානයට යොමු කොට ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා මූලික පියවරක් වශයෙන් අදාල රැස්වීම් වාර්තාවල සටහන් කොට තැබිය යුතුය.

11. සෑම හය මාසයකට වරක්ම අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව මෙම යෝජනා ක්‍රමය සමාලෝචනය කරනු ලැබ අවශ්‍ය අවස්ථාවන්හි දී අමාත්‍ය මණ්ඩලයට නිර්දේශයක් ඉදිරිපත් කරනු ඇත.

අ.කලේ/(පී.එන්.එම්. ප්‍රනාන්දු)
ලේකම්,
රාජ්‍ය පරිපාලන. පළාත් සභා හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.